සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 54 | S | I |
|---|---|---|

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 13 - 2019**

විභාග අංකය .............................   පෙරදිග සංගීතය I   කාලය පැය දෙකයි

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.**
- **1 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට (i) (ii) (iii) (iv) (v) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**
- **31 - 50 දක්වා උත්තර පත්‍රයේම පිළිතුරු සපයන්න.**

01. ග ස නි̣ ස්වර මත, න්‍යාස වන නිර්දේශිත රාගයකි,
    i. දේස් ii. තිලක්කාමෝද් iii. ජයජයවන්ති iv. භාගේශ්‍රී v. ආසාවරී (........)

02. අවරෝහණයේ දී රිෂභය වක්‍රව යෙදේ, ආරෝහණයේ දී ග, ධ දුර්වල වේ. මෙම ලක්ෂණ ඇතුළත් නිර්දේශිත රාගය වන්නේ,
    i. හංසධ්වනි රාගය ii. භෛරව රාගය iii. ජෞනපුරි රාගය
    iv. තිලක්කාමෝද් රාගය v. දේස් රාගය (........)

03. කෝමළ නිෂාදය විවාදීව යෙදෙන රාගයකි,
    i. භෛරව ii. ජයජයවන්ති iii. ආසාවරී
    iv. දේස් v. කාලිංගඩා (........)

04. රි ම ප, නි̲ ධ̲, ප, ම ප ධ̲, ම ප, ග̲, රි, ස මෙම ස්වර සංගතිය අයත් රාගය වන්නේ,
    i. භාගේශ්‍රී ii. දේස් iii. ජය ජයවන්ති
    iv. ආසාවරී v. කාලිංගඩා (........)

05. ම ග (ම) රි ස මෙම ස්වර සංගතියේ ''(ම)'' ස්වරය සංකේතවත් කරන රාගධාරී ශිල්ප ක්‍රමය වන්නේ,
    i. කන් ii. මුර්කි iii. ගමක් iv. මීන්ඩ් v. උපජ් (........)

06.

| ම ප ධ̲ ධ̲ | ස්̇ - රි̇ ස්̇ | ධ̲ ධ̲ ස්̇ ග̲̇ | රි̇ ස්̇ ධ̲ ප |
|---|---|---|---|

ඉහත සර්ගම් ගී පාදය අයත් රාගය වන්නේ,
    i. දේස් ii. ආසාවරී iii. ජෞනපුරි iv. කාලිංගඩා v. ජය ජයවන්ති (........)

07. ආරෝහණයේ රිෂභය දුර්වල නමුදු අවරෝහණයේ දී එය ප්‍රබලව යෙදෙන කර්ණාටක පද්ධතියට අයත් නිර්දේශිත රාගයකි.
    i. කාලිංගඩා ii. භෛරව iii. හංසධ්වනි iv. ආසාවරී v. ජය ජයවන්ති (........)

08. පර්සියානු සංගීතයේ බලපෑමෙන් පසුව ඉන්දීය සංගීතයේ සිදුවූ වෙනසක්මක් වන්නේ,
    i. හින්දුස්ථානී සංගීතය බිහිවීම ii. මේල 72 නිර්මාණය වීම
    iii. මූලික ස්වර 7 බිහිවීම iv. අපරදිග සංගීතය ඇසුරුකරගත් නිර්මාණ බිහිවීම
    v. වේද ග්‍රන්ථ බිහිවීම (........)

09. ෂෙහනායි වාදනයේ දී තාල වාදනය සඳහා සාම්ප්‍රදායිකව යොදාගනු ලබන භාණ්ඩය වන්නේ,
i. තබ්ලාව ii. මෘදංගය iii. පක්වාජ් iv. මද්දලය v. නක්කරා (........)

10. සදානන්ද පට්ටි ආරච්චි, පණ්ඩිත් රාම් නාරායන්, උස්තාද් සුල්තාන් ඛාන් ආදී ශිල්පීන්, වාදනයෙහි නිපුණත්වයක් දක්වන සංගීත භාණ්ඩය වන්නේ,
i. වයලීන් ii. සන්තූර් iii. බටනලා iv. සාරංගි v. ෂෙහනායි (........)

11. තමා යටතේ තබ්ලා වාදනය හැදෑරූ ශිෂ්‍යයින් විසින් ''අබ්බාජ්'' යනුවෙන් හැඳින් වූ සුප්‍රකට තබ්ලා වාදකයා වන්නේ,
i. උස්තාද් ශකීර් හුසේන් ii. උස්තාද් අෆාක් හුසේන් ඛාන් iii. උස්තාද් බඩේ ගුලාම් අලි ඛාන්
iv. පණ්ඩිත් අනින්දෝ චැටර්ජි v. උස්තාද් අල්ලා රක්ඛා ඛාන් (........)

12. ''චුප්කේ චුප්කේ රාතදින් නිකාහ්'' නම් වූ චිත්‍රපටයේ ඇතුළත් ගීතය ගැයූ ගායකයා,
i. පන්කාජ් උදාස් ii. ජග්ජිත් සිංග් iii. ගුළාම් අලි
iv. අනින්දෝ චැටර්ජි v. ජස්රාජ් සිං (........)

13. උස්තාද් බිෂ්මිල්ලා ඛාන් ලෝක ප්‍රසිද්ධ වන්නේ කුමන වාද්‍ය භාණ්ඩයක් වාදනය සඳහා ද ?
i. ෂෙහනායි ii. සන්තූර් iii. බටනලා iv. සාරංගි v. සිතාර් (........)

14. පහත වාදන භාණ්ඩ අතුරින් ''ජවා'' නමැති උපකරණයෙන් වාදනය කරන තත් වාද්‍ය භාණ්ඩය වන්නේ,
i. සරෝද් ii. සාරංගි iii. දිල්රුබා iv. වයලින් v. එස්රාජ් (........)

15. නාඩගම් නාට්‍ය කලාවේ දී ''තෝඩායම'' යනුවෙන් හඳුන්වන්නේ,
i. ගී පාදයක අග පිහිටි කිසියම් අක්ෂරයක් උචිත ස්වර රටාවන් අනුව තාලය නොබිඳෙන සේ ඇද පැද ලෙලවා ගායනා කිරීමයි.
ii. චරිත දෙකක් අතර ඇතිවන සංවාදයයි.
iii. මූලික ලය වෙනස් නොකොට තාලය ද්විගුණ කිරීමයි.
iv. ප්‍රේක්ෂකාගාරයෙන් නමස්කාරය හා සමාව අයැදීමයි.
v. චරිතයක් කරලියට ගෙන්වීමට යොදා ගන්නා කොටසයි. (........)

16. ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ගෙන් පැවත එන ගීත විශේෂයක් වූ වැදි ගී ඇසුරෙන් නිර්මාණය වූ ගීතයක් **නොවන්නේ**,
i. මල් නෑනී මං කැකුලී මං ii. රාජා ඕ මංගලියා iii. අනේ ගැටවුනේ
iv. නංගිට බැඳපු මල් වියනයි v. ඔටා දමංඤ්ඤා මර මර (........)

17. හොරණෑව සහ පහතරට බෙරය එක්ව වයන රංග සම්ප්‍රදාය වන්නේ මේ අතුරින් කුමක් ද ?
i. සොකරි ii. කෝලම් iii. ගීත නාටක iv. නූර්ති v. නාඩගම් (........)

18. නූර්ති පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
i. තබ්ලාව, හාර්මෝනියම්, වයලීනය ආදී මිහිරි හඬින් යුතු සංගීත භාණ්ඩ යොදාගෙන ඇත.
ii. ටවර් රඟහල වැනි නාට්‍ය ශාලා තුළ රඟ දක්වා ඇත.
iii. H.W. රූපසිංහ, රොම්ලස් පෙරේරා වැන්නවුන් විසින් සංගීතය සපයා ඇත.
iv. චාර්ල්ස් ඩයස්, ජෝන් ද සිල්වා ආදීන් විසින් නූර්ති නිර්මාණය කර ඇත.
v. නූර්ති සංගීතය සඳහා හනුමන් තෝඩි, කරහරප්‍රිය, හරිකාම්බෝජ ආදී රාග උපයෝගී කරගෙන ඇත.(........)

19. පහත දැක්වෙන ගී පාද අතුරින් 4 ක් එකම නාට්‍ය විශේෂයකට අයත් වේ. එසේ **නොවන** ගී පාදය අයත් වරණය වන්නේ,
i. පෙර සිට පැවත එන - සිරිතට පොදිය බැඳගෙන ii. ගම්භිර කාලිංග නුවර
iii. වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ iv. ආල වෙලා පියසේ පටන්
v. වරදක් ඇති මුත් මහතුනෙ (........)

20. ''මනුෂ්‍ය බුද්ධිය, අතිශයින්ම පුළුල් වූ, බොහෝ සෙයින් පොදුවේ පැතිර ගිය නිපුණතා සමූහයකින් සමන්විතය. දැනට ඉන් 8ක් මා ගණනය කළෙමි'' මෙම ප්‍රකාශයේ අයිතිය හිමි වන්නේ කා හට ද ?
i. සිග්මන් ෆ්‍රොයිඩ්   ii. හොවාර්ඩ් අර්ල් ගාඩ්නර්   iii. ඇල්ෆ්‍රඩ් බිනේ
iv. ජීන් පියාජේ   v. ජෙරම් එස් බ්‍රූනර්   (........)

21. පහත දැක්වෙන තොරතුරු අනුව නාඩගම් සම්ප්‍රදායට අයත් **නොවන** ප්‍රකාශය තෝරන්න.
i. ගී තනුවල ඒකාකාරී බවක් දක්නට ලැබේ.
ii. දමිළ තෙරික්කුත්තු නම් වීදි නාට්‍ය ක්‍රමයේ ආභාසය ලැබී ඇත.
iii. කරලිය නම් රංග මණ්ඩපයක රඟ දක්වයි.
iv. විශ්වනාත් ලෞජි විසින්, ගීත බොහොමයකට සංගීතය නිර්මාණය කර ඇත.
v. මද්දල් දෙකකින් තාල සපයයි.   (........)

22. කණ්ඩායම් සංගීතය සහිත සිංහල ගීයක් ගැයූ ප්‍රථම සංගීත කණ්ඩායම වන්නේ,
i. මූන්ස්ටොන්   ii. ලොස් කාබෙලරොස්   iii. ලා සිලොනියන්ස්
iv. සමනලයෝ   v. ත්‍රී සිස්ටර්ස්   (........)

23. ''තත් ජිත් තොන් නන් අකුලාගෙන සොඬ'' ලෙසින් ගායනය වන්නේ,
i. මංගලම්   ii. අස්නෙ   iii. ගණපති සවුදම   iv. වැලපුම්   v. ප්‍රශස්ති   (........)

24. උඩරට ශාන්තිකර්ම ගීතයකි,
i. සුද්ධෝධන රජුට දාව   ii. එර්දිවෙලා උඩු ගුවනේ වඩින්නේ   iii. ගුණදැනේ බෝසත් අනේ
iv. ආලවඩන ගන්ධ කුටියෙ   v. අන්ද්‍ර ගුවන් හැර   (........)

25. ලසු (LU) නමින් ස්වර හඳුන්වන සංගීත පද්ධතිය වන්නේ,
i. ඉස්ලාමික   ii. අපරදිග   iii. ගැමිලැන්   iv. චීන   v. පෙරදිග   (........)

26. පරිගණකය මගින් සංගීතය පටිගත කිරීමේ දී අත්‍යවශ්‍ය **නොවන** උපකරණයකි,
i. Scanner   ii. MIDI key board   iii. External sound card
iv. Monitor speaker   v. Microphone   (........)

27. ප̣ ස ප රි̇′ ලෙස තත් සුසර කල වයලීනයක් නැවත අර්ධ ස්වරයක් ඉහළට ගෙන සුසර කළවිට එම ස්වර 04 වන්නේ,
i. ධ̣ රි ධ ගි̇   ii. ධ̲̣ රි ධ̲ ගි̲̇   iii. ධ̲̣ රි̲ ධ̲ ගි̲̇
iv. නි̲̣ රි̲ ධ̲ රි̲   v. ධ̲̣ රි̲ ධ ගි̇   (........)

28. ඉපියා (Reeds) භාවිතය **නොමැතිව** වාදනය කරන අපරදිග සුසිර වාද්‍ය භාණ්ඩයකි. (Wind Instrument)
i. සැක්සෆෝන්   ii. ක්ලැරිනට්   iii. ඕබෝ   iv. බැසූන්   v. ත්‍රොම්බෝන් (........)

29. ''සඳකඩ පහනක'' හා ''සිනිඳු සුදු මුතු තලාවේ'' යන ගීතවලට පාදක වූ ස්කේල (Scale) දෙක පිළිවෙලින්,
i. $C, D^{m}$   ii. F, G   iii. $B^{b}, C$   iv. $A^{m}, C^{m}$   v. $C, B^{b}$   (........)

30. පහත සඳහන් ලාංකේය චිත්‍රපට අතුරින් ද්‍රවිඩ චිත්‍රපට අධ්‍යක්ෂකවරයෙකුගේ නිර්මාණයක් **නොවන්නේ**,
i. ඩිංගිරි මැණිකා   ii. සත් සමුදුර   iii. දිව්‍ය ප්‍රේමය
iv. සුජාතා   v. සැඩ සුළං   (........)

- **31 - 50 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු හිස්තැන මත ලියන්න.**

31. නිර්දේශිත රාග අතුරින් ''ස රි ම ප නි ස̇'' වශයෙන් ආරෝහණය දැක්වෙන්නේ ........................................ රාගයේ වන අතර ''ස රි ග ප නි ස̇'' යනුවෙන් ආරෝහණය දැක්වෙන්නේ ........................................රාගයේ ය.

32. ස ධ̲̣ නි̣ ස, ග ම ධ̲ ධ̲ ප ස්වර සංගතිය ........................................ රාගයට අයත් ස්වර සංගතියක් වන අතර ........................................ යන ස්වර සංගතිය ජයජයවන්ති රාගයට අයත් වේ.

33. රාත්‍රී දෙවන ප්‍රහාරයේ ගැයෙන පූර්වාංග වාදී රාගයක් වන .......................................... රාගය සහ .......................................... රාගය සමප්‍රකෘති රාගවේ.

34. කෝමළ රි, ධ වර්ගයේ රාග, ගායන සමය අනුව .......................................... රාගවන අතර, .......................................... රාගය රි ධ කෝමලව යෙදෙන රාගයකි.

35. සප්තකයේ උත්තරාංගයේ වාදී ස්වරය පිහිටන, සන්ධි ප්‍රකාශ **නොවන** නිර්දේශිත රාග යුගලය සඳහන් කරන්න. .......................................... , ..........................................

36. රි ග නි ස, ම ග රි ග නි ස, ප ම ග රි ග නි ස දේස් රාගයට අනුව මෙම ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවර 02 ලියන්න.

37. රාගයක අවම ලෙස තිබිය යුතු ස්වර සංඛ්‍යාව .......................................... ක් වන අතර .......................................... යන ස්වර දෙක එකවර ඉවත් කළ නොහැක.

38.

| ස ධ | ප ප ධ | ම ප | ම ග රි |

යනුවෙන් සර්ගම් ගායනය ආරම්භ වන්නේ .......................................... රාගයේ වන අතර

| රිස | නි ධ නි | ස - | ම ග ග | යනුවෙන් .......................................... රාගයේ සර්ගම් ගීතය ආරම්භ වේ.

39. නිර්දේශිත රාග අතුරින් .......................................... යනු ජනක රාගයකටත් .......................................... යනු ජන්‍ය රාගයකටත් උදාහරණ වේ.

40. ම ග රි ග ස ලෙස රිෂභය වක්‍රව යෙදෙන්නේ .......................................... රාගයේවන අතර රි ග රි ස නි ස ලෙස කෝමළ ගාන්ධාරය වක්‍රව යෙදෙන්නේ .......................................... රාගයේ ය.

41. හින්දුස්ථානී සංගීත පද්ධතිය තුළ ඇති වාද්‍ය භාණ්ඩයන් අතරින් ''ජවාරී'' සැකසීම .......................................... හි දක්නට ඇති අතර ෂ්‍යාහි නම් කොටස දක්නට ඇත්තේ .......................................... වේය.

42. ධා තිරිකිට ධිං - ධිං | ලෙස ආරම්භවන මාත්‍රා 16 කින් යුත් තාලය .......................................... ලෙස හැඳින්වෙන අතර, සියළුම විභාගයන්හි මාත්‍රා එකිනෙකට අසමාන තාලයක් ලෙස .......................................... තාලය හඳුනාගත හැකි ය.

43. කර්ණාටක සංගීතයට අයත් මේල ගණන .......................................... ක් වන අතර හින්දුස්ථානී සංගීතයේ රාග පදනම් වී ඇත්තේ මේල (ථාට) .......................................... ක් මතය.

44. ශාස්ත්‍රීය ඛ්‍යාල් ගායනයක දී වචන භාවිතා කරමින් ආලාප් කිරීම .......................................... ආලාප් ලෙසත් ස්වර අක්ෂර භාවිතයෙන් කෙරෙන ආලාප් .......................................... ලෙසත් හඳුන්වයි.

45. 25 වසරක ගසල් ගායනයෙන් පද්ම ශ්‍රී සම්මානයෙන් පිදුම් ලත් ගායකයා .......................................... වන අතර, වර්තමානයේ භාරතයේ සිටින අසහාය තබ්ලා වාදන ශිල්පියා වන්නේ .......................................... ය.

46. වෛද ගීතිකා උදාත්ත .......................................... , .......................................... යන නාද ස්ථාන තුන ඇසුරින් ගායනා කර ඇත.

47. එකම ස්ථානයකින් පහළ හා ඉහළ ස්වර ඉපදවීමේ හැකියාව ඇති, ගායකී වර්ගයට අයත් භාණ්ඩයක් ලෙස .......................................... හැඳින්විය හැකි අතර, .......................................... සිතාරයේ හා සාරාංගියේ සම්මිශ්‍රණයකින් සකසා ඇත.

48. $CDE^bFGA^bB^bC$ යන අක්ෂර නාම .......................................... Scale යට අයත් වන අතර එය හින්දුස්ථානී සංගීතයේ .......................................... මේලයේ ස්වරවලට සමාන වේ.

49. | ස ස ස | රි රි රි | ග - රි | ස - - | මෙම තනුව ග (කෝමළ ගාන්ධාරය) ශ්‍රැති ස්වරය ලෙස ගෙන ලියන්න.

..........................................................................................................................................................................

50. කර්ණාටක ක්‍රමයට වයලීනයේ තත් සුසර කිරීම .......................................... වන අතර, අපරදිග ක්‍රමයට පිළිවෙළින් එම තත් .......................................... ආකාරයට සුසර කරනු ලබයි.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

54 | S | II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019
**Third Term Test - Grade 13 - 2019**

විභාග අංකය ............................ | පෙරදිග සංගීතය II | කාලය පැය තුනයි

- **I කොටසින් ප්‍රශ්න දෙකකට ද II කොටසින් එක් ප්‍රශ්නයකට ද III කොටසින් ප්‍රශ්න දෙකකට ද ආදී වශයෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් හිමි වේ.**

## I කොටස

01. පහත සඳහන් ස්වර ඛණ්ඩ ඇසුරෙන් I - III දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) ස රි ම ප ධ ප ම ප ධ ප ම ග රි ස
(ආ) ස ග ම ධ නි ස̇ නි ධ ම ග රි ස
(ඇ) ග ප නි ස̇ නි ප ග ප ග ග රි ස
(ඈ) ග ම ධ නි ධ ප ම ප ග ම ග රි ස

i. ඉහත සඳහන් ස්වර ඛණ්ඩයන්ට අයත් රාග නම් කරන්න. (ල. 4)

ii. (අ) හෝ (ඇ) කොටසට අයත් රාගයේ මධ්‍යලය ගීතයක හෝ වාදිතයක **අන්තරා** කොටසෙහි ස්වර ප්‍රස්තාරය ලියා දක්වන්න. (ල. 6)

iii. ඉහත රාග 4 අතුරින් ඔබ කැමති රාග 2 ක් තෝරාගෙන එක් රාගයකට අදාළ ආලාප ඛණ්ඩයක් ස්වර 20කට නො අඩුවන සේ ලියා (සියළු සංකේත ඇතුළත් විය යුතුයි) අනෙක් රාගයට අදාලව තානාලංකාර 02ක් නියමිත තාල සංඥා සහිතව ලියා දක්වන්න. (ල. 10)

02. i. හංසධ්වනි, ජය ජයවන්ති, භාගේශ්‍රී යන රාග අතරින් ඔබ කැමති රාග දෙකක මේලය, ආරෝහණ, ජාතිය, මුඛ්‍යාංගය, ලියා දක්වන්න. (ල 8)

ii. ආලාප, තානාලංකාර, ගමක් ස්වර, තිහායි, සන්ධි ප්‍රකාශ රාග මින් 04 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න. (ල. 8)

iii. නිර්දේශිත රාගයක සර්ගම් ගීයක **ස්ථායි** කොටසක් ස්වර ප්‍රස්ථාර කරන්න. (ල. 4)

03. i. පහත අවනද්ධ අක්ෂර භාවිතයෙන් වාදනය කළ හැකි හින්දුස්ථානි තාල තුනක් නම් කරන්න. (ල. 3)

| | | |
|---|---|---|
| තිරිකිට | ධිං | ධා |
| තිං | තා | |

ii. ඉන් ඔබ කැමති හින්දුස්ථානි තාලයක සමගුණය හා දෙගුණය ලෙස ඨේකාව ප්‍රස්ථාර කරන්න. (ල. 4)

iii. මින් තාල දෙකක් තෝරාගෙන සමවිෂමතා දෙක බැගින් ලියා දක්වන්න. (ල. 4)

iv. තබ්ලා මුහුණතක් ඇඳ ඒ මත පහත අක්ෂර උපදින ස්ථාන ලකුණු කරන්න.
නා, ධිං, තිං, තුං , කත් (ල. 6)

v. තබ්ලාවේ ගුණාත්මක බව රැක ගැනීම සඳහා තබ්ලා වාද්‍ය ශිල්පියෙකු විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත් 03 ක් ලියා දක්වන්න. (ල. 3)

## III කොටස

04. i. පහත සඳහන් කරුණු වලින් **දෙකක්** තෝරාගෙන නිදර්ශන සහිතව විස්තර කරන්න.
a. හටන් ගී - ප්‍රශස්ති ගී
b. ආඝාතාත්මක - අනාඝාතාත්මක ගැමි ගීත
c. උඩරට ශාන්තිකර්ම - පහතරට ශාන්ති කර්ම (ල. 10)

ii. ඉහතින් ඔබ තෝරා **නොගත්** කොටසකට අදාළව ආඝාතාත්මක ගීයක මුල් ගී පාදයේ ගීත ස්වර ප්‍රස්ථාරය ලියා දක්වන්න. (ල. 4)

iii. එම ගීතයේ මුල් පාදයට අයත් සඳැස්මත් හා ගීමත් ගණන ලියා දක්වන්න. (ල. 2)

iv. ඉහත ඔබ ප්‍රස්ථාර කළ ගීතයට ගැළපෙන දේශීය බෙර පදයක් නියමිත තිත් සංඥා සහිතව ප්‍රස්ථාර කරන්න. (ල. 4)

## A කොටස

05. A (a) බුම්මැඩිය වාදනය කරයි
(b) ගැටබෙරය වාදනය කරයි
(c) අනාඝාතාත්මකව ගායනා කරයි
(d) දෙතිතට අයත් තිත් රූපයක් මත ගයයි
(e) ගීත ගායනයේ දී නර්තනය මෙන්ම විවිධ ශබ්ද උපයෝගී කරගනියි
(f) මුද්‍රප්පදය සහිත ගීත කොටසක් අඩංගු වේ.

## B කොටස

B (i) ලක්ෂ්මී බුජවාසා
(ii) තම් තම්දෙන තානම් - දන තම්දෙන තානම්
(iii) බෝගම්බර අපි නෙළුමට යනකොට
(iv) මොහු හැර වෙන දන් ගන්නෝ නැද්දෝ
(v) වැල් කොබ්බෑවල දුන්න නවාගෙන
(vi) ලේසි නොව බැඳ අල්ලා

i. ඉහත A කොටසේ ඇතුලත් කරුණු සඳහා උචිත ගී පාද B කොටසින් තෝරා ලියන්න.

(උදා - a = iii ) ( ½ x 6 ලකුණු - 03 )

ii. ඉහත B කොටසේ රෝම ඉලක්කම් (ii) යටතේ ඇති ගීත විශේෂය පිළිබඳ කරුණු 04ක් ලියන්න. (ල. 4)


iii. B කොටසේ (i) සහ (iii) කොටස්වලට අයත් ගීතයන්හි ලක්ෂණ 03 බැගින් ලියන්න. (ල. 6)

iv. A කොටසේ (b) යටතේ ඇති වාද්‍ය භාණ්ඩ උඩරට නර්තන සම්ප්‍රදායට අයත් වේ. වෙනත් දේශීය නර්තන සම්ප්‍රදායන් දෙකකට අයත් තාල වාද්‍ය භාණ්ඩ දෙකක් නම් කරන්න. (ල. 3)

v. ඔබ කැමති ගැමි ගීයක හෝ සෙ ගීයක මුල් ගී පාද 04 ක් ගීත ප්‍රස්තාර කරන්න. (ල. 4)

## III කොටස

06. i. බටහිර සංගීත, ස්වර ප්‍රස්තාරකරණයේ දී භාවිතා කරන පහත සඳහන් සංකේත වලින් කුමන කාර්යයන් ඉටුකරයි ද යන්න පැහැදිලි කරන්න. (ල. 8)


a. 

b. 

c. 

b 

ii. පහත සඳහන් අපරදිග සංගීත ස්වර තනුව පෙරදිග ක්‍රමයට පරිවර්තනය කරන්න. (ල. 6)



iii. මෙම නාද මාලාවට පදනම් වූ Major Scale ය නම් කරන්න. (ල. 2)

iv. එම ස්කේලයේ ස්වර ආරෝහණ අවරෝහණ ක්‍රමයට ලියන්න. (ල. 4)

07. i. සංධ්වනි (symphony), ඔපෙරා (Opera), බැලේ (Ballet) යන අපරදිග සංගීත නිර්මාණ කෘති අතුරින් **දෙකක** සුවිශේෂී ලක්ෂණ 04 බැගින් ලියන්න. (ල. 8)

ii. අපරදිග සංගීතයේ භාවිත හඬතල 04 නම් කර ඊට ගැලපෙන ලෙස වයලීන පවුලේ සංගීත භාණ්ඩ නම් කරන්න. (ල. 4)

iii. බටහිර සුෂිර වාද්‍ය භාණ්ඩ (Wind Instruments) වර්ග කර ඇති ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 4)

iv. G major Scale මත ලියා ඇති පහත ස්වර තනුවට ගැලපෙන family Chords සඳහන් කරන්න.

| ප - නි රි̇ | ස̇ - ග̇ - | ධ ම' රි - | ප - - - |

(ල. 4)

08. i. පහත සඳහන් පාරිභාෂික පද අතුරින් 02ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(a) සංගීතමය හා රිද්මයානුකූල බුද්ධිය

(b) සංගීත චිකිත්සාව

(c) සංගීත නිර්මාණ කටයුතු සඳහා පරිඝනකයේ දායකත්වය

(d) නාද ග්‍රහණය කිරීමේදී කර්ණේද්‍රියේ ක්‍රියාකාරීත්වය

(e) ප්‍රසංග වේදිකාවක භාවිත වන තාක්ෂණික මෙවලම් (ල. 8)

ii. පහත වගුවේ ස්වර සංඛ්‍යාත සම්පූර්ණ කරන්න.

| ස්වරය | ස | රි | ග | ම | ප | ධ | නි | සං | රිං |
|---|---|---|---|---|---|---|---|---|---|
| ස්වර සංඛ්‍යාතය | 256 | | | | 384 | | | 512 | |

(ල. 6)

iii. පහත නව ගී පද මාලාවට සුදුසු තනුවක් යොදා සුදුසු තාල රටාව අනුව ගීත ස්වර ප්‍රස්තාර කරන්න

තරු ද එබෙන - සඳු හිනැහෙන

සීත රැයක - ගත සුව දෙන (ල. 6)

## තෙවන වාර පරීක්ෂණය 2019 - පෙරදිග සංගීතය 13 ශ්‍රේණිය

## I පත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. ii | 6. ii | 11. v | 16. iii | 21. iv | 26. i |
| 2. v | 7. iii | 12. iii | 17. ii | 22. ii | 27. iii |
| 3. i | 8. i | 13. i | 18. v | 23. iii | 28. v |
| 4. iv | 9. v | 14. i | 19. iii | 24. v | 29. iv |
| 5. ii | 10. iv | 15. iv | 20. ii | 25. iv | 30. ii |

**1 සිට 50 දක්වා ලකුණු 02 බැගිනි**
**31 සිට 50 දක්වා පිළිතුරු යුගල සම්පූර්ණ නම් පමණක් ලකුණු 2 බැගින් හිමි වේ.**

31. දේස්, හංසධ්වනි
32. භෛරව, ගැලපෙන සංගතියක්
33. දේස්, තිලක්නාමෝද්
34. සන්ධි ප්‍රකාශ, කාලිංගඩා / භෛරව
35. ආශාවරී, ජෞනපුරි
36. ධ ප ම ග රි ග නි̣ ස, ̣නි ධ ප ම ග රි ග නි̣ ස
37. 05, -ම,ප
38. භෛරව, භාගේශ්‍රී
39. භෛරව / ආසාවරී, නිවැරදි රාගයක්
40. දේස්, ජය ජයවන්ති
41. සිතාරයෙ / තාම්පුරා / ආදී භාණ්ඩයන් , තබ්ලා
42. තිලවාඩා, ධමාර්
43. 72, 10
44. බෝල්, සර්ගම්
45. පන්කජ් උදාස්, ශකීර් හුසේන්
46. අනුදාත්ත, ස්වරිත
47. බටනලාව, දිල්රුබා
48. C minor , ආසාවරී
49. |ග ග ග | ම ම ම| ප - ම| ග - -|
50. ස̣ ප̣ ස ප , ප̣ රි ධ ගं / G D A E

## II පත්‍රය

01. i. (අ) ආසාවරි (ආ) භාගේශ්‍රී (ඇ) හංසධ්වනි (ඈ) භෛරව (ල. 4)
 ii. ප්‍රස්තාරය නිවැරදි නම් (ල. 6)
 iii. ආලාප කොටසට (ල. 6)
 තානාලංකාර දෙකට (ල. 4)
 (ලකුණු 20)

02. i. රාග දෙකෙහි රාග විස්තර සඳහා (ල. 8 )
 ii. කරුණු 04 ට (ල. 2 x 4 = 8)
 iii. ප්‍රස්තාරය නිවැරදි නම් (ල. 4)
 (ලකුණු 20)

03. i. තිලවඩා, දීප් චන්දි, ත්‍රිතාල් ලෙස නම් කිරීමට (ල. 3)
 ii. සම, දෙගුණ ඨේකා ප්‍රස්තාර කිරීමට (ල. 2x 2 = 4)
 iii. සමානතා 02 ල. - 2 විෂමතා 02 ල. - 2 (ල. 4)
 iv. තබ්ලා මුහුණත ඇඳීම (ල. 6)
 v. ක්‍රියාපිළිවෙත් ලිවීමට (ල. 3)
 (ල. 20)

04. i. කරුණු 02 විස්තර කිරීම සඳහා (ල. 10)
 ii. ගී පාද දෙකෙහි ගීත ස්වර ප්‍රස්තාර ලිවීම (ල. 4)
 iii. සඳැස්මත් හා ගීමත් ගණන ලිවීමට (ල. 2)
 iv. බෙර පදය ප්‍රස්තාර කිරීමට (ල. 4)

05. i. (a) iii (b) ii (c) iv (d) vi (e) v (f) i (ල. ½ x 6 = 3)
 ii. නිවැරදි කරුණු 04 ලිවීමට (ල. 4)

iii. ලක්ෂණ 3 ලිවීමට (ල. 6)
iv. පහතරට බෙරය සහ දවුල ලෙස නම් කිරීමට (ල. 1½ x 2 3)
v. ගීතයේ ගීත ප්‍රස්තාර කිරීම සඳහා (ල. 4)
(ල. 20)

06. i. (a) - Minim rest (b) - D Major / key Signature (c) - Time Signature
(d) - Dotted minim ලෙස නම් කර කාර්ය පැහැදිලි කිරීමට (ල. 4 x 2 = 8)

ii.
| ම ග රි රි | නි ස රි | + රි ග ම | - ධ නි | රි - ස | නි - - |

(ල. 6)

iii. $B^b$ Major Scale (ල. 2)

iv. $B^b$ C D $E^b$ F G A $B^b$
$B^b$ A G F $E^b$ D C $B^b$ (ල. 4)
(පෙරදිග ක්‍රමයට ලියූවිට දී ද ලකුණු ලබාදෙන්න) (ලකුණු 20)

07. i. කෘති 2ක් පිළිබඳ විස්තර සැපයීමට (ල. 2 x 4 = 8)
ii. හඬතල 4 සහ සංගීත භාණ්ඩ නම් කිරීමට (ල. 4)
iii. සුෂිර වාද්‍ය භාණ්ඩ වර්ග කර පැහැදිලි කිරීමට (ල. 4)
iv. G | C | D | G | ලෙස Chords ලකුණු කිරීමට (ල. 4)
(ලකුණු 20)

08. i. පාරිභාෂික පද 2 පිළිබඳව කෙටි සටහන් ලිවීමට (ල. 4 x 2 = 8)
ii.

| ස්වරය | ස | රි | ග | ම | ප | ධ | නි | ස | රි |
|---|---|---|---|---|---|---|---|---|---|
| ස්වර සංඛ්‍යාතය | 256 | 288 | 320 | 340 | 384 | 426 | 484 | 512 | 576 |

ලෙස හෝ ආසන්න සංඛ්‍යාතයට පිළිතුරු භාර ගන්න. (ල. 6)
iii. සුදුසු තාලයට සුදුසු තනුවක් යොදා ඇත්නම් (ල. 6)
(ලකුණු 20)